**වත්තල මාබෝල නගර සභාව - 2022**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වත්තල මාබෝල නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වත්තල මාබෝල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ)  (iii) වගන්තියේ සඳහන්  අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 4 ක ශේෂ එකතුව රු.173,875,104 ක් වුවද උපලේඛ අනුව ශේෂයන්ගේ එකතුව රු.170,456,053 ක් වූයෙන් රු.3,419,051ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් හෝ උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ලැබුණු රු.74,556 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ගිණුම සහ උපලේඛන අතර, එම ප්‍රමාණයෙන් වෙනසක් පැවතුණි. | පුස්තකාලය වර්ෂයේ ලැබීම් ලෙස පරිග්‍රහන ලේඛනයට වර්ෂය තුළ ඇතුළත් කරන ලද පොත් වන අතර ලැබීම් ලෙස මුදලින් ගෙවන ලද හා එම වර්ෂයේ මුදලින් නොගෙවුවත් පුස්තකාලය වෙත ලැබී ඇති පොත් වන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතුවේ. |

### 1.6.2 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවෙහි සංශෝධිත මූල්‍ය ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතට රු. 8,150,079 ක නිරවුල් නොකළ අවිනිශ්චිත ශේෂයක් පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 92,229,387 ක් වූ ගිණුම් ශේෂ 6 ක් ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | නව ආකෘති අනුව ඉදිරියේදී ලේඛන සකස් කරන බව සහ කාලවිශ්ලේෂණ ඉදිරියේදී ඉදිරිපත් කරන බව. | ලේඛන පිළියෙල කර පවත්වාගෙන යා යුතු අතර කාලවිශ්ලේෂණ ඉදිරිපත් කළ යුතු වේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.74,202,464 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු. 48,496,019 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම රු. | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | `000 රු. | `000 රු. | `000 රු. | `000 රු. | `000 රු. | `000 රු. | `000 රු. | `000 රු. |
| (i) වරිපනම් හා බදු | 57,544 | 57,407 | 48,402 | 62,063 | 56,692 | 58,038 | 49,312 | 56,692 |
| (ii) කුලී | 16,733 | 21,182 | 22,068 | 16,784 | 18,548 | 15,773 | 13,307 | 14,753 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,797 | 1,129 | 1,958 | - | 2,212 | 912 | 1,364 | - |
| (iv) වෙනත් ආදායම් | 103,231 | - | 89,702 | - | 188,433 | - | 136,334 | - |
| | 179,305 | 79,718 | 162,130 | 78,847 | 265,885 | 74,723 | 200,317 | 71,445 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු** | | |
| (අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට වූ රු.55,807,222 ක හිඟ වරිපනම් ශේෂයෙන් දෙසැම්බර් 31 දිනට අය කර තිබූ මුදල රු.11,517,132 වූයෙන් අය කිරීම්වල ප්‍රතිශතය සියයට 21 ක් විය. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | පනතේ විධිවිධාන අනුව හිඟ ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කසල අපහරණ ගාස්තු ශේෂය රු.8,461,376 ක් විය. | ලේඛන වල පවතින වැරදි නිවැරදි කිරීමට අනුමැතිය ලැබී ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකරගැනීමට කටයුතු කරමින් පවතින බව. | අතුරු ව්‍යවස්ථා අනුව හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**කුලී**

**----**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වෙළෙඳ ස්ථාන කුලී හා නිවාස කුලී හිඟ ශේෂය ලෙස රු.16,835,859 ක් වූ අතර, ඉන් රු.6,385,068 ක් එනම්, සියයට 38 ක් වර්ෂ 5 කට අධික කාලයක සිට පැවත එන ශේෂයක් විය. | රු.2,780,966 ක් සඳහා නඩු පැවරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ගිණුම් අනුව හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ඉඩම් සමීක්ෂණයේදී හඳුනාගෙන තිබූ සභාව සතු ඉඩම් දෙකක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනයේ ලේඛනගත කිරීමේදි ඇති වූ දෝෂ, උපලේඛනවල අඩුපාඩු නිසා මෙම වෙනස්කම් සිදු වී ඇති බව. | ලේඛන යාවත්කාලීන කර නිවැරදි වටිනාකම් ඇතුලත් කළ යුතුය. |
| (ආ) මුද්දර ගාස්තු ආදායමෙන් ගෙවීම් කිරීම සඳහා සභාව වෙත පලාත් පාලන කොමසාරිස් විසින් කම්පැක්ටර් රථයක් ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ඒ සඳහා ගෙවිය යුතුව රු.6,774,000 ක ශේෂයක් තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී මුද්දර ගාස්තු ආදායමින් ඒ රථය වෙනුවෙන් එකතුව රු.6,840,000 ක වාරික අයකරගෙන තිබූ අතර ඒ අනුව රු.66,000 ක් වැඩිපුර ඒ සඳහා ගෙවා තිබුණි. එම රථය ලබාදීම සම්බන්ධයෙන් වාරික අය කරන ක්‍රමවේදය හෝ වෙනත් කිසිදු කොන්දේසියක් සම්බන්ධව අදාල පාර්ශවයන් සමඟ ගිවිසුමකට එළඹීමට හෝ එකඟතාවයක් ඇතිකරගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | අදාල පාර්ශවයන් සමඟ ගිවිසුමක් හෝ එකඟතාවයක් ඇති කර ගෙන නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) නගර සභාවෙන් බැහැරට ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 07 දෙනෙකුගෙන් රු.1,162,532 ක් හා සේවය අතහැර ගිය නිලධාරීන් 96 දෙනෙකුගෙන් රු.251,466 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ ශේෂය පිළිබඳ අදාල කාර්යාලය දැනුවත් කර ඇති බව. | හිඟ ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) මූල්‍ය ප්‍රකාශ තුල ජංගම වත්කම් යටතේ වර්ෂ 10 ක පමණ කාලයක සිට ඉදිරියට ගෙන එන අගරු චෙක්පත් 04 ක රු.240,702 ක් වූ ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු. 5865 ක් සංශෝධිත ජර්නල් අංක 06 මඟින් නිවැරදි කර ඇති බව. | -එම- |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුලත් තොරතුරු අනුව, සභාව සතු ඉඩම් 15 කට අදාලව ඔප්පු අංක සඳහන් කර නොතිබුණු බව අනාවරණය වූ අතර ඉඩම් සම්බන්ධව හිමිකම් තහවුරු කර ගැනීමට ඔප්පු සකස්කර ගැනීම සභාවේ මූලිකම කාර්යයක් වුවද එසේ සිදුකර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරන බව. | ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලයේ ආයතන පිරිසැකැස්ම සකස් කිරීම වෙනුවෙන් පුද්ගලික ආයතනයක් වෙත සමාලෝචිත වර්ෂයේදී රු. 922,985 ක් ගෙවා තිබුණි. මෙම ආයතනය තෝරා ගැනීම සඳහා ලංසු කැඳවීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ඇ) සහ 2.6.1 අ (ii) අනුව කටයුතු සිදුකර නොතිබුණි. | ආයතන 2 කින් පමණක් මිළ ගණන් ලැබී ඇති අතර අදාල ස්ථානයේ සැලසුම් ඉදිරිපත් කර මිළ ගණන් කැදවා ඇති බව සඳහන් කරමි.පිරිවිතර ඇතුළු ලංසු ලේඛන සකස් කර නොමැති අතර සැලසුම් අනුව මිල ගණන් ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත. තාක්ෂනික ඇගයීම් කමිටු තීරණය මත කොන්ත්‍රාත්කරු තෝරාගෙන ඇත.ඉදිරියේදී පිරිවිතර සකස් කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික මට්ටමේ සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු 29 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 4 ක පුරප්පාඩු 7ක් ද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 2 ක පුරප්පාඩු 2 ක් ද විය. | පුරප්පාඩු පිරවිමට අදාලව කාර්ය මණ්ඩල වාර්තා 2023.03.31 දිනට ප්‍රධාන ලේකම් ( බ.ප ) වෙත යොමු කර ඇත. පවතින කනිෂ්ඨ සේවක පුරප්පාඩු පළාත් පාලන කොමසාරිස් (බ.ප) ගේ අංක LGD/2G/පුරප්පාඩු/පොදු/2021 හා 2021.08.16 දිනැති ලිපිය අනුව කටයුතු කිරිමට නියමිත බව. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය |